PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය, 2020.07.13

සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය,

සුවසිරිපාය,

නො. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

කොළඹ 10

ගරු අමාත්‍යතුමියනි,

**ජන ජීවිත අවධානමට නොහෙලා කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ මැතිවරණ පැවැත්වීම සම්බන්ධ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා නිකුත් කළ සෞඛ්‍යමය විධිවිධාන ගැසට් කර නීතිමය වලංගුභාවයක් ලබාදීම.**

2020.08.05 වන දින පැවැත්වීමට සැලසුම් කොට ඇති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා කොවිඩ් 19 වසංගත තත්වය තුළ ජන ජීවිත ආරක්ෂා වන පරිදි මැතිවරණ පැවැත්වීම පිළිබඳව මාර්ගෝපදේශ මාලාවක් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය විසින් හඳුන්වාදෙනු ලැබීය.

අනතුරුව මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ විවිධ පාර්ශවයන්ගේ මෙන්ම සෞඛ්‍ය ආයතන වලද අදහස වූයේ මාර්ගෝපදේශ නිකුත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් එකී මාර්ගෝපදේශ වලට පටහැනිව කටයුතු කරන අවස්ථාවක නෛතික පියවර ගැනීම ප්‍රායෝගිකව අපහසු හෙයින් ඒ අතුරින් සුදුසු විධිවිධාන ප්‍රමාණයක් නීතියක් බවට පත්කල යුතු බවත්ය. ඒ අනුව අදාල සෞඛ්‍ය මාර්ගෝපදේශ ගැසට් කරන බවට විවිධ දින වකවානු ප්‍රකාශ කලද මෙතෙක් එකී සෞඛ්‍ය මාර්ගෝපදේශ නෛතික ප්‍රතිපාදනයක් බවට පත් කිරීම සිදුව නොමැත.

ඊයේ (09) දිනය වන විට සමාජය සමග සබඳතා පැවැත්වූ කොරෝනා රෝගියෙකු හමුවූ අතර ඇය සංචරණය කළ ප්‍රදේශය හා ඇසුරු කළ ආශ්‍රිතයන්ද සම්බන්ධයෙන් නිවැරදි උපකල්පනයක් සිදුකල නොහැකි වීම තුළ මතුව ඇත්තේ ගැටලුකාරී තත්ත්වයකි. මෙවැනි ගැටලුකාරී සහගත වටපිටාවක මැතිවරණ ප්‍රචාරණ කටයුතුද සිදුවන හෙයින් සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිබඳව ප්‍රමුඛ අවධානයක් යොමුකල යුතු බව අපගේ විශ්වාසයයි. සෞඛ්‍ය මාර්ගෝපදේශ ගැසට් නොකලද ජනතාව අවදානමකට ලක්නොවන පරිදි ප්‍රචාරක කටයුතු සිදුකිරීම මැතිවරණයට තරඟ වදින අපේක්ෂකයින්ගේ මෙන්ම දේශපාලන පක්ෂ නායකයින්ගේද ප්‍රමුඛ වගකීම විය යුතුය. නමුත් අවාසනාවට මෙන් පසුගිය කාලසීමාව තුළ දිවයින පුරා සිටින අපගේ නිරීක්ෂකයින් වාර්තා කර සිටියේ දේශපාලන පක්ෂ නායකයින් මෙන්ම අපේක්ෂකයින්ද සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිබඳව තැකීමක් නොකර ප්‍රචාරක කටයුතු වල නියැලෙන බවයි. මහජන නියෝජිතයින් ලෙස ඡන්ද ව්‍යාපාරයේ නියැලුනද සෑම

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

විටම ජන ජීවන සුරක්ෂිත වන අයුරින් කටයුතු කිරීම අපේක්ෂකයින්ගේ ප්‍රමුඛ වගකීමක් බව අවධාරණය කරමු.

උක්ත කරුණු පිළිබඳව ඔබතුමියගේ කාරුණික අවධානය යොමු කර ජන ජීවිත සුරක්ෂිත කිරීම සඳහා මැතිවරණ ක්‍රියාවලියට අදාල වන සෞඛ්‍ය විධි විධාන, නිරෝධායනය හා රෝග වැළැක්වීමේ අඥාපනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ගැසට් කර නෛතික ප්‍රතිපාදනයක් බවට පත්කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

මෙම කාරණය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා මෙන්ම සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන්ද එකසේ වැදගත් වන හෙයින් ජන මාධ්‍ය සඳහාද නිකුත් කළ බව කාරුණිකව දන්වමි.

පිටපත - උනන්දුවක් දක්වන සෙසු ආයතන